# බදු සහ තවත් කතා

**බදු ගැන කල්පනා කරද්දී අපේ මනසට නැගෙන මුල්ම අදහස් වන්නේ 'පටලැවුණු ඉලක්කම්', 'පසුම්බියෙන් මුදල් ඉවතට යෑම', 'කොළ වාර්තා පිරවීම', 'බදු උපදේශකරුවන් සොයා යෑම' සහ 'බදු කාර්යාල තුළ රස්තියාදුව' වැනි දේය. එසේම තවත් සමහරුන්ට බදු ගෙවීම සහ ඊට සම්බන්ධ කරුණු 'කරදරයක්', 'අනිවාර්ය දෙයක්', ඉවරයක් නැති දෙයක්', ලෙසින් දැනේ. නමුත් බදු ගෙවීම යනු අපත් අප වටා ඇති සමාජයත්, රටත් අතර සබඳතාවක් ගොඩනගන ශක්තියක් බව කිසි විටකත් අමතක නොකළ යුතු කරුණකි. බදු ක්‍රමය රඳා පවතින්නේ එකිනෙකා සමග තිබෙන විශ්වාසය, ගරුකිරීම සහ සහයෝගීත්වය මතය. අමාරුවෙන් වෙහෙසී උපයන මුදලින් කොටසක් බදු ලෙසින් ආපසු රටේ සංවර්ධනයට ලබාදෙන බදු ගෙවන්නා රටකට ශක්තියකි. නිහතමානීව සහ වගකීමෙන් බදු ක්‍රියාවලියට එකතු වී සිටින මොහු රටේ ආර්ථිකය නැංවීමට දායක වන නොපෙනෙන වීරයෙකි. නමුත් මොවුන් විසින් පෙරළා බලාපොරොත්තු වන දෙයක් ද ඇත. ඒ කුමක්දැයි අපි අද කතා කරමු.**

## බදු යනු ආයෝජනයක්

මීට දශක කිහිපයකට පෙර ලෝකයේ බොහෝ රටවල බදු එකතු කෙරුණේ බලහත්කාරයෙනි, මිනිසුන් බිය ගන්වමිනි. නමුත් කාලයත් සමග අද වන විට බදු ගෙවන්නා කේන්ද්‍රීය කරගත් සුහදශීලී ක්‍රම තුළින් බදු රැස් කිරීම වඩාත් පලදායි බව බදු නිලධාරීන් විසින් තේරුම් ගෙන ඇත. මෙම තත්ත්වය අප රටෙහි ද දැකිය හැක. බදු යනු මුදලක් පමණක් නොව, මුදල් වටිනාකමින් ඔබ්බට ගියා වූ ගිවිසුමකි, ආයෝජනයකි, කැපකිරීමකි යන කරුනු තේරුම් ගත් බදු නිලධාරීහු යුක්තිය සහ ගරුත්වය මත පදනම් වූ පරිසරයක් තුළ බදු එකතු කර ගැනීමට කටයුතු කරමින් සිටිති.

බදු ගෙවීම යනු සංකීර්ණ හැඟීම්වල එකතුවකි. බදු ගෙවන්නන්ට ඒ හැඟීම්වලින් මිදිය නොහැක. බිය, පීඩනය, කේන්තිය, කලකිරීම, දුක වැනි සෘණාත්මක හැඟීම් මෙන්ම තවත් සමහරකුට සතුට, ආඩම්බරය වැනි ධනාත්මක හැඟීම් බදු සම්බන්ධයෙන් ඇති වන්නේ ඔවුන්ගේ අත්දැකීම්, දැනුම, අවබෝධය සහ ආකල්ප වලට අනුකූලවය. මෙම තත්ත්වය මනාව තේරුම් ගෙන ක්‍රියා කරන බදු නිලධාරීන්ට තමා හමුවට සාධාරණයක් හෝ සහනයක් හෝ බලාපොරොත්තුවෙන් පැමිණෙන බදු ගෙවන්නා අපහසුවට පත් නොකර කරුණු හොඳින් පැහැදිලි කර දී ඔවුන් බදු ක්‍රමය තුළ තවදුරටත් රඳවා ගැනීමට අවස්ථාව උදා කර ගත හැක.

අප නිතරම උත්සාහ කළ යුත්තේ බදු ගෙවන්නා ගෙන් ලැබිය යුතු බදු එකතු කරගැනීමට පමණක් ද? විවිධ තැප කිරීම් කරමින් බදු ගෙවන පුද්ගලයා එසේ බදු ගෙවන්නේ කැමැත්තෙන් ද, සතුටින් ද නැතිනම් ඔවුන් බලාපොරොත්තු වන වෙනත් කිසියම් හෝ දෙයක් තිබේ ද කියා සොයා බලා ඒ සඳහා කටයුතු කිරීම තුළ බදු ගෙවන්නන් දිරිමත්වනවා පමණක් නොව කාර්යක්ෂම බදු ක්‍රමයක් ද රට තුළ ස්ථාපිත කළ හැක.

බදු ගෙවන්නන් විසින් බලාපොරොත්තු වන විශේෂ කරුණු කිහිපය අතරේ ඔවුනට සත්‍යමය පිළිගැනීමක් ලබාදීම, නිතරම සාධාරණත්වයක් හිමිකර දීම, බදු ක්‍රමය හැකි තරම් සරල කරදීම, අවශ්‍ය බදු දැනුම ලබාදීම, පැමිණිලි, යෝජනා, සහ අනෙකුත් දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීම වැනි කරුණු මූලික වේ.

## බදු නිලධාරීන්ගේ වගකීම

බදු ගෙවන්නන්ට අවශ්‍ය වන්නේ නිතරම පණිවිඩ යවා බදු ගෙවන ලෙසට, වාර්තා බාරදෙන ලෙසට මතක් කිරීම පමණක් නොව, ඔවුන්ගේ කැපකිරීම සහ රටෙහි ආර්ථිකයට කරනු ලබන මූල්‍ය දායකත්වය ගැඹුරු සමාජීය වගකීමක් ඉටුකිරීම ලෙස බදු නිලධාරීන් විසින් පිළිගැනීමයි. බදු ගෙවන්නා තම ගැටලු දුරකථනයෙන් හෝ මුණගැසී හෝ සාකච්ඡා කරද්දී ගරු සරු ඇතිව කතා කිරීම, ඔවුන් කියන දේ හොඳින් අසා සිටීම සහ ඊට සුදුසු පිළිතුරු කාර්යක්ෂමව ලබාදීම බලාපොරොත්තු වේ. දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ උපදේශන සේවා අංශයේ නිලධාරීන්, ලේකම් අංශයේ නිලධාරීන් සහ ක්ෂණික ඇමතුම් සේවා ස්ථානයේ නිලධාරීන් විසින් බදු ගෙවන්නන්ට වුවමනා උපදෙස් ලබා දෙමින් දැනුවත් කිරීම් කරමින් විශිෂ්ට සේවාවක් ලබා දෙමින් පවතී.

බදු ගෙවන්නන්ගේ ගැටලු එකිනෙකට වෙනස්ය. ඔවුන්ගෙන් ලැබෙන බදු දායකත්වය සහ බදු අනුකූලතාව ද අසමානය. මේ විවිධත්වය තුළ බදු ගෙවන්නන් සැබවින්ම බලාපොරොත්තු වන්නේ සමානත්වය නොව සාධාරණ සේවයකි. ලොකු වුවත් පොඩි වුවත් තමාගේ ගැටලුව තමාට වටිනා නිසා මෙම වෙනස හඳුනාගනිමින් කටයුතු කළ යුතු බව බදු ගෙවන්නන්ගේ විශ්වාසයයි. උදහරණ වශයෙන් විගණන සඳහා බදු ලිපිගොනු තෝරාගැනීමේ දී විනිවිද භාවයෙන් යුතු ක්‍රමානුකූල පදනමකට එනම් බදු ගෙවන්නන්ගේ බදු අනුකූලතා හැසිරීම මත පදනම් වූ ක්‍රමයකට ලිපි ගොනු තෝරාගැනීම (Risk-based auditing) දැනටමත් සිදු කෙරේ. මීට අමතරව ඉතා ඉහළ ආදයම් ලබන පුද්ගලයින්ගේ තොරතුරු අධීක්ෂණය කිරීම සඳහා විශේෂිත අංශයක් පිහිටුවා ඇත. විවිධ පුද්ගලයින්ගේ මුදල් ගනුදෙනු සම්බන්ධ තොරතුරු ලබාගැනීමටත් එම තොරතුරු වැඩිදුර විමර්ශනයට ලක් කිරීමටත් විශේෂිත අංශ ස්ථාපිත කර ඇත. මෙසේ කටයුතු කිරීමෙන් බදු ගෙවන ජනතාවගේ විශ්වාසය ගොඩනැගීම බදු නිලධාරීන්ගේ අරමුණයි.

බදු යනු සංගීතය, චිත්‍ර වැනි බහුතරයකට රසවත් විෂයක් නොවේ. ගිණුම්කරණ, බදු නීතිය වැනි විෂයයන් වැඩි දෙනකුගේ ආකර්ෂණයට ලක් නොවන බව අමුතුවෙන් කීමට වුවමනා නැත. නමුත් සාමාන්‍ය මට්ටමකට හෝ බදු දැනුම ලබා තිබීම බදු ගෙවන්නකුට අවශ්‍ය වන්නේ එමගින් නොදැනුවත්කම නිසා සිදුවිය හැකි අයහපත් ප්‍රතිඵල අවම කරගත හැකි නිසයි. දේශීය ආදයම් දෙපාර්තමේන්තුව විසින් මේ වන විට බදු නීති රීති සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමට විවිධ වැඩසටහන් ආරම්භ කර ඇත. බදු උපදේශන අංශය විසින් බදු නීතියෙහි සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබන අතර එක් එක් ව්‍යාපාර මූල්කරගත් සංගම්, කණ්ඩායම් සඳහා ද ඔවුන් විසින් කරනු ලබන ඉල්ලීම මුල් කරගනිමින් බදු දැනුම බෙද ගැනීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. දේශීය ආදයම් දෙපාර්තමේන්තු මුහුණු පොතට සහ යූටියුබ් චැනලයට ජනතාවගේ බදු දැනුම වැඩි කිරීමේ අරමුණින් නිර්මාණය කරන ලද විවිධ තොරතුරු ඇතුළත් අංග එකතු කර ඇත. තවද ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ බදු සම්බන්ධ විවිධ පුවත් සහ තොරතුරු මහජනතාවට ගෙන යෑමට ද කටයුතු කරන බදු දෙපාර්තමේන්තුව බදුකරණය සම්බන්ධයෙන් පැවැත්වෙන විවිධ සම්මන්ත්‍රණ, දේශන සඳහා සම්පත් දායකත්වය ලබා දීමට ද නොපැකිළව උත්සාහ කරමින් සිටී.

සරල වූ බදු ක්‍රමයක් තුළ ජීවත් වීම බදු ගෙවන්නන්ගේ තවත් එක් බලාපොරොත්තුවකි. එනම් බදු නීතිය, බදු ක්‍රියා පටිපාටි ඇතුළු බදු වාර්තා සහ ගෙවීම් පත්‍රිකා දක්වා බදු ගෙවන්නා විසින් භාවිත කළ යුතු ලේඛන කියවා සැනෙකින් තේරුම් ගත හැකි ලෙස සකසා තිබීම බදු ගෙවන්නා ආකර්ෂණය කර ගත හැකි සාර්ථක මගකි. තනි පුද්ගල බදුගෙවන්නන් වෙනුවෙන් සරල කරන ලද බදු වාර්තාවක් "Simplified Income Tax Return" මෑතක දී හඳුන්වා දීමෙන් දේශීය ආදයම් දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වූයේ බදු ගෙවන්නන්ගේ කාලය ඉතිරි කර දීමටයි. එසේම නොතේරුම්කම නිසා ගිණුම්කරුවකුගේ සේවය වෙනුවෙන් කළ වියදම අඩු කර දීමටයි. "සරල කරන ලද බදු වාර්තාවක්" හරහා පොදු ජනතාවට, විශේෂයෙන්ම කුඩා ව්‍යාපාරිකයින්ට හා ස්වයං රැකියාවක නියුතු පුද්ගලයන්ට, අවම තොරතුරු සහිතව තම බදු වාර්තා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඇත. එයට අමතරව e-filing ක්‍රමය තුළින් මිනිසුන්ට තම බදු ගිණුම් සහ බදු වාර්තා අන්තර්ජාලය ඔස්සේ භාරදිය හැක. ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිපාලන දෘශ්‍යාවලියට ගැලපෙන ආකාරයකට බදු පද්ධතිය යාවත්කාලීන කර ඇති බව මෙයින් තහවුරු වේ. තවද බදු දැනුම කැටි කළ විවිධ දැන්වීම්, කෙටි ඉදිරිපත් කිරීම් සමාජ මාධ්‍ය තුළින් ජනතාවට ලබා දීමට දේශීය ආදයම් දෙපාර්තමේන්තුව අඛණ්ඩව උත්සාහ කරමින් සිටින අතර එම කටයුත්ත භාෂා ත්‍රිත්වයෙන්ම සකස් වී තිබීම තවත් සුවිශේෂී කරුණකි. මේ මගින් දේශීය ආදයම් දෙපාර්තමේන්තුව ඍජුවම ජනතාව සමග සම්බන්ධ වීමට උත්සහ දරයි. රටට ආදයම් එකතු කරන ආයතනයක් ලෙස පමණක් නොව, බදුගෙවන්නන්ගේ යහපත සඳහා ද ක්‍රියාකරන ආයතනයක් ලෙස වර්තමානයේ දේශීය ආදයම් දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටින බව මෙම කරුණු තුළින් මනාව පැහැදිලි වේ.

## ජනතාවට පැමිණිලි කිරීමේ හැකියාව

බදු ගෙවන ජනතාවට තම පැමිණිලි, යෝජනා, සහ අනෙකුත් දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ද අත්‍යාවශ්‍ය කරුණකි. තමාට සිදුවන අසාධාරණයක් ඍජුවම කොමසාරිස් ජනරාල් දක්වා සිටින ඉහළ නිලධාරියකු හමු වී කතා කිරීමේ නිදහස බදු ගෙවන්නකුට හිමිය. එසේත් නැතිනම් ලිඛිතව තැපැල් මගින් හෝ විද්‍යුත් තැපැල් මගින් දේශීය ආදයම් කොමසාරිස් ජනරාල් දක්වා තම ගැටලු යොමු කිරීමට ද ඉඩක් ඇත. දේශීය ආදයම් දෙපාර්තමේන්තු ප්‍රධාන ගොඩනැගිල්ලෙහි බිම් මහලෙහි ස්ථාපිත කර තිබෙන 'පැමිණිලි හා යෝජනා' බහාලුමට තමාගේ ගැටලුව යොමු කිරීමට අවස්ථාවක් ඇත. බදු ගෙවන්නා විසින් මෙසේ යොමු කරනු ලබන කාරණා සම්බන්ධයෙන් සොයා බලා වැඩිදුර කටයුතු කිරීමට 'අභ්‍යන්තර කටයුතු' (Internal Affairs) නමින් විශේෂිත අංශයක් ද මෑතකදී ස්ථාපිත කිරීමට දේශීය ආදයම් දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත්තේ බදු ගෙවන්නන්ගේ හැඟීම්, බලාපොරොත්තු සැබවින්ම තේරුම් ගත් නිසාය.

බදුගෙවන පිරිසට කාර්යක්ෂම සේවාවක් ලබාදීම ද අත්‍යාවශ්‍ය කරුණකි. බදු ගෙවන්නන් විසින් ද එවැනි සේවාවක් බලාපොරොත්තු වීම ඉතා සාධාරණය. බදු දෙපාර්තමේන්තුවේ බිම් මහලෙහි පනවා ඇති නව බදු සේවා පරිශ්‍රය තුළදී TIN සහතික ලබාගැනීමට, PIN සහ DIN අංක ලබාගැනීමට සහ වෙනත් බදු උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සූදානම් කර ඇත.

ඉහත කරුණු තුළින් බදු ගෙවන්නන්ගේ අයිතිවාසිකම් හැකි උපරිම ලෙසින් ලබාදීමට දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නිරතුරුව උත්සාහ කරන සැටි මනාව පැහැදිලි වේ. ජනතාව හා ආදයම් බදු දෙපාර්තමේන්තුව අතර විශ්වාසය, සහයෝගීත්වය හා සාධාරණත්වය පදනම් කරගත් නව බදු සංස්කෘතියක් බිහි කළ හැක්කේ අප සියලුදෙනා එකතු වී තම තමන්ගේ යුතුකම් ඉටු කළහොත් පමණි. එවිට නිරායාසයෙන්ම අපගේ අයිතිවාසිකම් ද දිනා ගැනීමට හැකිවනු ඇත. බදු ගෙවන්නන් විසින් රටෙහි පවතින බදු නීතියට අනුව නිවැරදිව, නිසි වෙලාවට, බදු වාර්තා භාරදී අදාල බදු මුදල් ගෙවිය යුතුය. ඔවුන්ගේ සහයට සිටින බදු උපදේශකයින් සහ ගිණුම්කරුවන් විසින් නිතරම තම සේවාලාභියා දැනුවත් කරමින් ඔවුන් නිවැරදි මාවතේ තබමින් රටට අයවිය යුතු බදු මුදල එකතු කර දීමට සහය විය යුතුය. බදු නිලධාරීන් විසින් බදු ගෙවන්නා වෙත ප්‍රශස්ත සේවාවක් ලබා දෙමින් ඔවුන්ගේ විශ්වාසය ගොඩනඟමින් කටයුතු කළ යුතුය. මෙසේ නිර්මාණය වන බදු ක්‍රියාවලිය රටෙහි ආර්ථිකයට ශක්තියකි.

බදු ගෙවන්නන්ගේ බලාපොරොත්තු ඉටු කරමින් ලස්සන හෙට දිනක් උදාකිරීමට දේශීය ආදයම් දෙපාර්තමේන්තුව සූදානමින් සිටී.

**ආචාර්ය නදී දිසානායක**
**නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**
**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**



01 වැනි පිටුවෙන්....

ඊශ්‍රායල - ඉරාන යුද ගැටුම් ඇවිලෙයි

කොළඹ නගර සභාවේ විශ්‍රාමිකයන් තවමත් නිල නිවාසවල